# බහු සංස්කෘතික අධ්‍යාපනය හා එහි ලක්ෂණ

## බහු සංස්කෘතික සමාජ හැඳින්වීම.

අම්පේ විමලධම්ම හිමි

"බහු සංස්කෘතික සමාජයක් යනු පිළිගත් විවිධ ජාතීන් භාෂා වශයෙන්, පංති වශයෙන්, ආගම් වශයෙන් හෝ ගෝත්‍ර වශයෙන් සංස්කෘතික වශයෙන් බෙදී ඇති සමාජයි."

- ලින්ච්, 1986 -

"බහු සංස්කෘතික සමාජ යනු විශ්ව කණ්ඩායම්වලින් සැදුනු සමාජයකි."

- ස්කොට් පාමර් 1975 -

"සමාජ පංතිය ආගම සම්බන්ධයෙන් වෙනස්කම් ඇති සමාජයක් "

- සිංගල්ටන් 1977 -

"සංස්කෘතික වෙනස්කම් හා අනන්‍යතාව එකම රටක විවිධ ජාතීන් අතර පෙන්නුම් කරන සමාජය බහු සංස්කෘතික සමාජයකි."

- ග්ලේසර් හා මොයින්හාන් 1976 -

"එකම දේශපාලන ප්‍රදේශයක් තුළ මිනිස් සමූහය එකට වාසය කරන නමුත් එක් එක් කණ්ඩායම් තමන්ට ආවේණික සංස්කෘති, ආගම්, භාෂාව, අදහස් හා චාරිත්‍ර අගය කරමින් ජීවත් වේ."

- ෆර්නිවොල් 1948 -

උක්ත අදහස් බැලීමේදී මානව වර්ගයා තම තමන්ට ආවේණික වූ විවිධ සාධක අනුව වෙන් වෙන් වශයෙන් ජීවත් වීමට දරන උත්සාහය නිසා ඔහු සංස්කෘකිත වශයෙන් වෙනස් වේ. එම බහු ස්ංස්කෘතික බව සඳහා බලපාන ප්‍රධාන සාධක තුනකි.

1. බහු භාෂීය සමාජ
2. බහු ජාතීය සමාජ
3. බහු ආගමික සමාජ

බහු භාෂීය සමාජ යනු භාෂා කිහිපයක් කථා කරන කණ්ඩායම් සහිත ඒවා වේ. උදාහරණයක් ලෙස ලංකාවේ සිංහල, දෙමළ, භාවිත වීම, ඉංදියාවේ හින්දි , බෙන්ගාලි, පන්ජාබි, දෙමළ, ඉංග්‍රිසි, කර්ණාටක ආදි භාෂා භාවිත වීම දක්විය හැකිය.

බහු ජාතීය සමාජ යනු ජන කොටස් දෙකක් හෝ ඊට වැඩි ගණනක් වාසය කරන රටවල්ය. උදාහරණ ලෙස ලංකාවේ හා



ඉන්දියාව ගත හැකිය. ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් හා බර්ගර් යන ජාතීන් වාසය කිරීම ගත හැකිය.

බහු ආගමික සමාජ යනු විවිධ ආගම් අදහන සමාජ වේ. උදාහරණ ලෙස ලංකාවේ බුද්ධාගම, හිංදු ආගම ,ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම ඇදහීම දක්විය හැකිය.

මේ අයුරින් සෑම ජන කණ්ඩායමක්ම තමන්ට ආවේණික වූ ජීවන රටා, චාරිත්‍ර චරිත්‍ර අනුගමනය කරමින් එකම භූගෝලීය ප්‍රදේශයක ජීවත් වන අතර එම සංස්කෘතික විවිධතාව ආරක්ෂාකර ගැනීමට ද උත්සාහ දරයි. මේ නිසා ඔවුන් විවිධ ජන කොටස් ලෙස වෙන් වී ඇත. ඔවුන් තුළ භේද ඇතිවීමට බලපා ඇත්තේ තම සංස්කෘතිය පමණක් අගය කිරීමත් අන්‍ය සංස්තෘතීන් උසස් බව පිළිගැනීමට ඇති අකමැත්ත නිසාත් ය. ස්වකීය අනන්‍යතාව රැකගැනීමට උත්සාහ දැරීම මීට හේතුව වේ.

ලෝකයේ විවිධ රටවල විවිධ ප්‍රදේශවල විවිධ ජන කොටස් තමන් ජීවත් වන සමාජවලට ආවේණික චර්යා පද්ධතීන් ගොඩනගා ගැනීමත් ඒවාට අනුගත වී කටයුතු කිරීමත් අතීතයේ සිට දැකිය හැකිය. එසේ හැසිරීම සඳහා පාරිසරික, භූගෝලිය හෝ සමාජීය සාධක බලපායි. ඇතැම් සමාජ සමාජවාදී ලෙස දක්වන්නේ දේශපාලන මුහුණුවර අනුවය. කාර්මික හෝ කෘෂිකාර්මික සමාජ ලෙස දක්වන විට ආර්ථික තත්ත්වය විස්තර වේ. ගැමි හා නාගරික සමාජ ලෙස දැක්වීමේදී පාරිසරික තත්ත්වය පිළිබඳ අදහස්ක ඉස්මතු වේ. ඒ අනුව දේශපාලනය ආර්ථිකය හෝ සංස්කෘති පදනම් කරගෙන සමාජ හඳුන්වා ඇත.

විවිධ ජන කණ්ඩායම්වල විවිධ හැසිරීම් සංස්කෘතිය ලෙස දැක්විය හැකිය. උක්ත සංස්කෘති භේද අනුව වර්ගවලට බෙදී ඇත. ඒ අනුව එක් සමාජයක් තුළ බහු ජාතීය, බහු වාර්ගික හා බහු ආගමික වශයෙන් බෙදී ගිය ජනතාවක් එකට වාසය කරයි.

මෙසේ විවිධ වර්ගකර දැක්වූවද එම මිනිස් සමාජය කිසියම් සම්බන්ධතාවයක් මත ගොඩනැගී ඇත. එම සමාජයේ ජීවත් වන පුද්ගලයින් අතර වන අන්තර්ක්‍රියාකාරීත්වය මත ඔවුන් අතර පොදුවේ පිළිගත් යම් යම් අදහස් , චර්යා හෝ ගති සිරිත් ආශ්‍රය කරගෙන බහු සංස්කෘතික සමාජයක් ගොඩනැගෙයි.

උක්ත සංකීර්ණ සංස්කෘතීන් සහිත සමාජ බහු සංස්කෘතික සමාජ වන අතර ඒවා ඇතිවීමට බලපාන සාධක කිහිපයකි.

1. දේශපාලන රැකවරණය හෝ සුවදායක පරිසරයක බලාපොරොත්තුවෙන් සමීප රටවල් දෙකක් අතර වන සංක්‍රමණයන්
2. වෙළදාම හෝ ආගම ප්‍රචාරය කිරීමේ අරමුණින් යටත්විජිතවාදීන් විවාහ ආදිය ගිවිසාගැනීම නිසා ඒ ඒ රටවල පදිංචි වීම
3. රාජ්‍ය ප්‍රතිපත්ති නිසා
4. විදේශ රැකියා නිසා
5. සම්මාන පුරවැසියන් නිසා
6. සංචාරක ව්‍යාපාර නිසා

උක්ත කරුණු මූලික කරගෙන බහු සංස්කෘතික සමාජ බිහි වේ.

## බහු සංස්කෘතික අධ්‍යාපනය

සංස්කෘතීන් දෙකක් හො වැඩි ගණනක් පවතින විට ඒ සඳහා ගැළපෙන අධ්‍යාපනය බහු සංස්කෘතික අධ්‍යාපනය ලෙස දැක්වේ. එම අධ්‍යාපනය සුළු ජාතිකයන් විවිධ ආගමිකයන්, සංක්‍රමණිකයන් අනාථයින් සඳහා වෙන්වූ අධ්‍යාපනයකි.

මෙවැනි සමාජවල මිනිසුන් අතර සමාජීය වශයෙන් පවත්නා සම්බන්ධතා ඔවුන්ගේම යහපත පිණිස මෙන්ම අයහපත පිණිසද යොමුවන අතර එය සමස්ත පද්ධතිය කෙරෙහි බලපායි. විවිධ ආකල්ප අරමුණු ඔස්සේ සමාජයේ විවිධ පැතිකඩ පිළිබඳ අවබෝධයක් ලබා දීමටත් සමාජයේ මතුපිට හා ඇතුළත පෙනෙන නොපෙනෙන ගැටළු හා ප්‍රවණතාවයන් පිළිබඳව අවබෝධයක් ලැබීමත් බහු සංස්කෘතික අධ්‍යාපනය වේ. "අධ්‍යාපනය සැපයිය යුත්තේ විවිධ සංස්කෘතින් පිළිබඳව අපක්ෂපාතී ආකල්ප වර්ධනයකි."

- රංජිත් රුබේරු 1988 -

උක්ත කරුණු අනුව අධ්‍යාපනයෙන් අපක්ෂපාතී ලෙස වෙනත් සංස්කෘතීන් හැදෑරීමේ අවස්ථාව ඇතිකිරීමටත් සමබර ලෙස ඒවා පිළිබඳව ආකල්ප සකස් කිරීමත් කළ යුතුව ඇත.

"යමෙකුගේ මනස දියුණු කිරීමටත්, යමෙකුට දැනුම හා සංස්තෘතිකය ලබා ගැනීමටත් ඇති ඉඩකඩ වැඩිවෙමින් පවතින



සමයේ සමාජයත් අධ්‍යාපනයත් අතර සමීප සම්බන්ධතාවක් පැවතීම විශේෂ ලක්ෂණයක් බව පෙනේ. මින්සුන් සමාජීය ජීවිතය සඳහා සුදුස්සන් කරවීමේහිලා ද ඒ අනුව හැඩගැස්වීමෙහිලා ද අධ්‍යාපනය හැම කල්හිම වැදගත් මෙහෙයක් ඉටුකොට ඇත."

- ඒඩ්ගා ෆෝරේ ඇතුළු පිරිස 1978 -

උක්ත පැහැදිලි කිරීම අනුව මින්සුන්ගේ ජීවිතය සමාජ හිතකර ලෙස සකස් කිරීමේ කාර්යය පැවරී ඇත්තේ අධ්‍යපනයටය. එහිදී පවතින ආකල්ප වෙනස් කිරීමටත් එවා හිතකර ලෙස සංවර්ධනය කිරීමත් සිදුවිය යුතුය. එහිදී වෙනත් සංස්කෘතීන් පිළිබඳව අවබෝධය ලබා දීමට සුදුසුම ක්‍රමය අධ්‍යපනය යන්න පැහැදිලිවේ. පාසල කුඩාකළ සිට එකට සිට විවිධ පුද්ගලයින් අධ්‍යාපනය ලබන ස්ථානය වේ. එම කාලයේදී සංස්කෘතික වෙනස්කම් පිළිබඳ අවබෝධයක්ද නැත. සියලු දෙනා එක හා සමාන ලෙස සිතා කටයුතු කරයි. ඒ අනුව තම සංස්කෘතිය හා වෙනත් සංස්කෘතීන් පිළිබඳව අධ්‍යාපන ලාබාදීමට ඇති හොදම ස්ථානය පාසල වේ. එහි දී වෙනත් සංස්කෘතින් පිළිබඳ අදහස සිසුන් තුළට ප්‍රවිෂ්ඨ කරවීම ද ඉතා පහසු වනු ඇත.

සෑම සංස්කෘතියක් තුළ ම ජීවත් විය හැකි සාක්ෂරතාවක් ලබාදීම මෙහිදී සිදුවිය යුතුය. පොදු සාක්ෂරතාව මෙන්ම සංස්කෘතිය පිළිබද සාක්ෂරතාවයද, කථාබහ, ජනමාධ්‍ය භාවිතය කියවීම, මනාලෙස අවබෝධ කරගැනීම ආදියට බෙහෙවින් ඉවහල් වේ. විවිධ සංස්කෘතික කණ්ඩායම් අනුව ජන වර්ගවලට බෙදී ඇති අතර ජාතික ඒකාග්‍රතාව ඇතිකිරීම සඳහා අධ්‍යාපනය යොදාගත යුතු බව මෙම සංකල්පයෙන් අවධාරණය කෙරෙයි.

බහු සංස්කෘතික අධ්‍යාපනය අවශ්‍ය වන්නේ විවිධ සංස්කෘතික කණ්ඩායම් රැසක් එකට වාසය කරන අවස්ථාවලදීය. අන්තර්ක්‍රියා පැවැතිවීම තුළින් සමීප සම්බන්ධතාවන් පවත්වා ගැනීම එවැනි කණ්ඩායම්වල කාලීන අවශ්‍යතාවක් වේ. ගෝලීයකරණය වූ සමාජයක තාක්ෂණික දැනුම බෙදා ගැනීම අවශ්‍ය වී ඇත. වෙනත් සංස්කෘතීන් ජාතින් රටවල් මත යැපීම හා අන්තර්ක්‍රියා පැවැත්වීම අත්‍යවශ්‍ය වී ඇත. එහිදී සියලු පුද්ගලයින් සමඟ කටයුතු කළ හැකි පුද්ගලයන් බිහි කිරීම අධ්‍යාපනයේ වර්තමාන අවශ්‍යතාවක් වී ඇත.

වෙනත් සංස්කෘතීන්හි වඩාත් ගුණාත්මක ලක්ෂණ ඇතිවිට එවා තම සංස්කෘතියට උකහා ගැනීම කාලීන අවශ්‍යතාවයකි. ඒවායින්

තම සංස්කෘතිය පෝෂණය කරගැනීමට බහු සංස්කෘතික අධ්‍යපනය වැදගත් වේ. සෑම සංස්කෘතියක්ම හුදකලාව පොෂණය වූ ඒවා නොවේ. එවා වෙනත් සංස්කෘතීන්ගේන් පොෂණය ලබා ඇත. උදාහරණ ලෙස ලංකාවේ සංස්කෘතිය සඳහා මුල්කාලීනව භාරතීය සංස්කෘතිය බලපා ඇත. වෙනත් රටවලට විවිධ සංස්කෘතික කණ්ඩායම් වලින් ලබාගත හැක පෝෂණය ගැන අවබෝධයක් ලබා ගැනීමට බහු ස්ංස්කෘතික අධ්‍යාපනය ඉතා වැදගත් වේ.

බහු සංස්කෘතික අධ්‍යපනය මඟින් වෙන්ත සංස්කෘතීන් පිළිබඳව ඇති සාවද්‍ය වූ හැඟීම් නැති කළ හැකිය. යුරොපීය ජනතාව පෙරදිග ජනතාව ගැන සිතන ආකාරය මෙහිදි වැගත්වේ. ආසියානු ජාතිකයන් සියලු දෙනා කළු ජාතිකයන් වන බවත් ඔවුන් සියලු දෙනා සමාන වන බවත් ඔවුන් ම්ලේච්ඡ හා බිහිසුනු අය වන අතර ඔවුන් පහත් අය ලෙසත් සිතීම බටහිර ජාතීන්ගේ ආකල්පය වන්නේය. නමුත් විවිධ සංස්කෘතීන්හි ජාතීන් එක්ට වාසය කිරීමෙන් එවැනි අවබෝධයන් දුරුකර ගැනීමත් විභාග ආදියට ඉදිරිපත් විමෙන් සම අවස්ථා උදාකර ගැනීමත් සිදුවේ. අප්‍රිකාණු ආදී කළු ජාතිකයන් ගේ රැකියා විරහිත භාවය අවම කරගැනීමටත්, පහත් රැකියාවල නිරත වීම අවම කරග ගැනීමටත් මෙහිදි බහු සංස්කෘතික අධ්‍යාපන ඉතා වැදගත් වේ.

සුළු ජාතික කණ්ඩායම්වලට වන අසාධාරණ ක්‍රියා වැළැක්වීමට බහු සංස්කෘතික අධ්‍යපානය යොදාගත හැකිය. ඔවුන්ගේ අධ්‍යාපන අවස්ථා අවම වීමත්, ඉල්ලීම් නොසළකා හැරීම, පැත්තකට කිරීම, සංස්කෘතික අනන්‍යතාව මකා දැමීම වැනි ක්‍රියා ගොලීයකරණය හමුවේහි වැඩි වශයෙන් පවතින මෙන් යුගයක මෙම අධ්‍යපනය ඉතා වැදගත්වේ. බටහිර රටවල පවතින සුදු කළු භේදයද, ආසියාතිකයන් පහත් කොට සැළකීමද අවම කිරීම සඳහා බහු සංස්කෘතික අධ්‍යාපනය යොදාගත හැකිය.

## බහු සංස්කෘතික අධ්‍යාපන ක්‍රියාවලියක අඩංගු විය යුතු ප්‍රධාන ලක්ෂණ

විවිධ රටවල ජාතීන් මිශ්‍රව වාසය කිරීම, ජාතිවාදය, වර්ණභේදය වැඩි වශයෙන් පැවතීම හේතුකොටගෙන බහු සංස්කෘතික



අධ්‍යාපනය අවශ්‍ය වී ඇත. යුනෙස්කො සංවිධානයේ ජොම්තියන් වාර්තාව(1990) සැමට අධ්‍යාපනය යන අදහස ව්‍යාප්ත විය. වර්තමානයේ සහශ්‍ර සංවර්ධන ඉලක්කවල එය සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලෙස දක්වා ඇත. එය වර්ෂ 2015 වනවිට සපුරා ගැනීමට අපේක්ෂිතය. මෙය බහු සංස්කෘතික අධ්‍යාපනයට අනුබල දෙන්නකි. සංස්කෘතික අධ්‍යාපනයක පහත සඳහන් අරමුණු ඇතුළත් වීම වඩාත් යෝග්‍ය වේ.

1. පුද්ගල සමූහ එකිනෙක මත යැපෙන බවත්, අන්තර් සබඳතා පැවැතිවීම අත්‍යවශ්‍ය බවත්, අධ්‍යාපන ක්‍රියාවලියෙන් අවබෝධකර දීම.
2. ජාතිවාදය තුරන් කිරීමට පුද්ගලයින් දැනුවත් කිරීම.
3. අධ්‍යාපන පද්ධතිය තුළ විවිධ වාර්ගික ළමුන්ගේ සුවිශේෂ අවශ්‍යතා සැළකිල්ලට ගතයුතු වීම.
4. යම් ප්‍රදේශයක හෝ රටක පවතින සංස්කෘතික විවිධත්වය ඇගයීමට සුදුසු මානසිකත්වයක් ඇතිකළ යුතු අතර, එම සංස්කෘතික විවිධත්වය විෂයමාලාවන්හි පිළිබිඹු විය යුතුය.
5. යම් වාර්ගික කණ්ඩායමක අයිතිවාසිකම් ඍජු ව හෝ වක්‍ර මාර්ගවලින් උල්ලංඝනය වන ආකාර හඳුනාගෙන එවා තුරන් කිරීමට යොමුවන ආකල්ප වර්ධනය කිරීම.
6. විවිධ වාර්ගික කණ්ඩායම්වලට දේශපාලන බලය පිළිබඳ වැටහීමක් ලබා දීමෙන් අනාගතය තීරණය කිරීමේ හැකියාව තමන් සතු විය යුතු බව වටහා දීම.

("ආසියානු ජාතිකයන් පිළිබඳ බ්‍රිතාන්‍ය සිසුන්ගේ සංජානනය" වාර්තාව)

## බහු සංස්කෘතික අධ්‍යාපන ප්‍රවේශ

බහු සංස්කෘතීන් පවතින රටවල් උක්ත අධ්‍යාපනය ලබාදීම සඳහා ප්‍රධාන වශයෙන් අනුගමනය කරන ප්‍රවේශ දෙකක් ඇත. එනම්,

1. බහු සංස්කෘතික ප්‍රවේශය
2. ජාතිවාදී විරෝධී ප්‍රවේශය.

විචාරශීලීව අතිකුත් ජාතීන් ගැන සිතිමටත්, ඒ අනුව එම සංස්කෘතීන්ට ගරු කිරීමටත් ආභාෂයක් ලබාදීම බහු සංස්කෘතික ප්‍රවේශයේදී සිදු වේ. ජාතිවාදී හැඟීම් බිඳ දැමීම ජාතිවාදී විරෝධී ප්‍රවේශයේදී සිදුවේ. විප්ලවකාරී අධ්‍යාපන ප්‍රවේශයක් ලෙස හැඳින්වේ. මෙය අදහස් ඇති අයගේ එම අදහස් මුලින් උපුටාදැමීම අපේක්ෂිතය. ඇමරිකා එක්සත් ජනපදය බහු සංස්කෘතික අධ්‍යාපනය ලබාදෙන රටකි. එහි දී බහු සංස්කෘතික ප්‍රවේශය ක්‍රම තුනක් යටතේ සිදුවේ.

1. විෂයමාලා ප්‍රතිසංවිධානය කිරීම.
2. අන්තර් සංස්කෘතික අධ්‍යාපනය
3. සුළු කණ්ඩායම්වල සාධනය වර්ධනය කිරීමේ විශේෂ පිළිවෙත්.

ඊට අදාළව විෂයමාලා ප්‍රතිසංවිධානය ක්‍රම කිහිපයකට සිදුවේ.

1. විවිධාකාර ජාතීන්ගේ ජාතික දින උත්සව පවත්වා ඒ දිනවල ජාති වාර්ගිකයන් පිළිබඳ අවබෝධයක් ලබාදීම.
   උදා - වීරදින උත්සව ආදිය.
2. සම්පූර්ණ විෂය නිර්දේශ ප්‍රතිසංවිධානය කිරීම, ජාතිවාදී අදහස් මකාදමන අන්දමට ඇමරිකානු ඉන්දියානු ජනතාව පිළිබඳ නව අර්ථකථනයක් දෙමින් ඔවුන්ගේ වැදගත්කම හුවා දැක්වීම.
3. සුවිශේෂ මාතෘකා පමණක් ඇතුළත් කිරීම.

වාර්ගිකයන් අතර අන්තර් සම්බන්ධතා වර්ධනය කිරීමත් ප්‍රතිජනනාත්මක ආකල්ප ඇති කිරීමත් වඩාත් යෝග්‍ය වේ. සුළු ජාතික කොටස්වල අද්දැකීම් පෝෂණය කිරීම හා අධ්‍යාපනයට සහය වීම ද අනුගමනය කෙරෙයි.

1. ධනාත්මක ආකල්ප හා චර්යා වර්ධනය අන්තර් කණ්ඩායම් අතර පැවතීම.
   විවිධ කණ්ඩායම් අතර තමන්ගේ අපේක්ෂා වඩාත් සතුටුදායක අන්දමින් ළගාකරගත හැකි ආකාරයේ කණ්ඩායම් සහයෝගී තාවයක් තිබිය යුතුය.



2. ප්‍රජාතන්ත්‍රවාදී දර්ශනයක් පැවතීම.
   ප්‍රජාතන්ත්‍රවාදී දර්ශනය පදනම් කරගෙන බහු සංස්කෘතික අධ්‍යාපනය සකස් කිරීමට අවධානය යොමුකළ යුතුය. සමාජයේ ප්‍රජාතාන්ත්‍රිය බව ඇතිකිරීමට ගුරුවරුන්ට එය ප්‍රබල ආධාරකයක් වේ. උදාහරණ ලෙස ඇමරිකා එක්සත් ජනපදය ගත හැකිය.
3. සමාග්‍රහණ ක්‍රියාවලිය
   විවිධ සාධක පදනම් කරගනිමින් බෙදී වෙන් වූ ජන කණ්ඩායම් එකම ඒකකයක් ලෙස යොමු වන ලෙස බහු සංස්කෘතික අධ්‍යාපනය සකස් විය යුතුය.
4. සංස්කෘතික ඒකාග්‍රතාව ඇතිකරීම
   වෙනත් සංස්කෘත්ගේ විවිධත්වය අවබෝධ කරගනිමින් පුද්ගලයන් අතර විෂමතාවක් ඇති නොවන ලෙස ඒකාග්‍රතාවයෙන් කටයුතු කිරීමට සැළැස්වීම.

   මෙහිදී අන්තර් සංස්කෘතික සාවද්‍ය සන්නිවේදන න්‍යාය ඉතා වැදගත් වේ. මෙම න්‍යායට අනුව ගැටුම් ඇතිවීමට හේතු වන්නේ විවිධ සංස්කෘතික සන්නිවේදන ශෛලීන්හි ඇති අසමමිතික භාවය හේතුවෙනි. එම අසමමිතිකභාවය දුරුකිරීම සඳහා මෙයින් අපේක්ෂා කරයි. එහිදී

   1. ගැටුම් පාර්ශවකරුන් අතර ඔවුනොවුන්ගේ සංස්කෘතීන් පිළිබඳව දැනුව වැඩිකළ යුතුය.
   2. තම සංස්කෘතිය පිළිබඳ සෘණ ආකල්ප දුරුකළ යුතුය.
   3. අන්තර් සංස්කෘතික ලෙස සත්‍ය හුවමාරු වීමට සැළැස්විය යුතුය

   (ගැටුම් නිරාකරණයට හැඳින්වීමක් -2003)
5. විධිමත් විෂයමාලාව හා අත්දැකීම බහු සංස්කෘතියේම ප්‍රතිබිම්බයක් වීම.
   ළමුන් ලබන අත්දැකීම් ඔවුන්ගේ අදහස් හා සන්නිවේදන ක්‍රම ළමුන්ගේ සංස්කෘතියට හානි නොවන පරිදි එකම සංස්කෘතියට සමාන්තාරව යන විෂයමාලාවක් සකස් කිරීම වැදගත්ය.
   උදා - ක්‍රීඩා - ක්‍රිකට්, රගර්
6. ගුරුවරුන් හා පරිපාලකයන් ගරුකරන ළමා පිරිසක් බිහි කිරීම.
   බහු සංස්කෘතික පාසලක උගන්වන ගුරුවරයාගේ භූමිකාව සාමාන්‍ය පාසලක ගුරුවරයෙකුගේ භූමිකාවට වඩා වෙනස්ය.

ඔහු සියලු ළමුන්ට ගරු කරන සමානව සලකන පුද්ගලයෙකු විය යුතුය. සංස්කෘතික හා වාර්ගික ගැටුම් අවම වන ලෙස භෞතික සම්පත් භාවිත කළ යුතුය.

උදා - සිංහල උත්සව දින - නමුත් වෙනත් ජාතීන්ගේ දින පිළිබඳව ද ඉගැන්වීම කළ යුතුය.

7. සැඟවුණු විෂයමාලාව සංස්කෘතික හා වාර්ගික විවිධත්වය අවම වන පරිදි භාවිත කිරීම.

මේ අනුව සංස්කෘතික විවිධතාව භාෂාත්මක , ආකල්පමය හා හැසිරීම් රටාවට අනුව විවිධතාවන් අවම කිරීම සඳහා ඔවුන්ගේ ආකල්ප වර්ධනය සඳහා සැලසුම් සකස් කළ යුතුය.

8. පාසල් උපදේශකයින් තුළ ඉහළ අපේක්ෂණ පවතී. වාර්ගික භාෂාත්මක වශයෙන් ප්‍රතිෂේධාත්මක අදහස් තිබූ ළමුන්ට ධනාත්මක ආරමුණු පිහිටුවා ගැනීමට අවශ්‍ය සහය දීම පිළිබඳව අවබෝධයක් ඔවුන්ට තිබිය යුතුය.

9. ඉගැන්වීමේ ක්‍රම

සියලු දෙනාම සමාන ලෙස සළකා ඉගැන්වීම් ක්‍රම භාවිත කළ යුතුය. පොදුවේ පිළිගත් වාර්ගික විවිධත්වය සැළකිල්ලට නොගෙන පොදුවේ පිළිගත් ඉගැන්වීම් ශෛලියක් ඔස්සේ ඉගැන්වීමට පෙළඹවීම. මෙහිදි සංස්කෘතික සමතාවය ඇතිකිරීමට යොදාගන්නා භාෂාව ඉතා වැදගත් වේ.

"කොළඹ හා වෙනත් නාගරික ප්‍රදේශවල ජීවත් වන බටහිර ගැති ප්‍රභූවරුන්ගේ අඛණ්ඩ ග්‍රහණය නුරුස්නා බව පළ කළහ. මෙම කෝප සහගත හැඟීම "කඩුව" යන්නෙන් මොනවට පැහැදිලි වේ. "කඩුව" ස්වකීය පන්ති බලය යොදා සිංහල හා ද්‍රවිඩ භාෂා කතා කරන්නා වූ බහුතරය කපා හෙළීම සඳහා ඉංග්‍රීසි කතා කරන්නා විසින් යොදාගනු ලබන දෙයක් ලෙස පෙන්වන ලදී."
(තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිසම් සභා වාර්තාව - 1990)

අධ්‍යාපනය හා සංස්කෘතිය අතර පවතින සම්බන්ධතාව "ජාතික අධ්‍යාපන කොමිසම් සභා පළමුවන වාර්තාවේ" (1992) මෙසේ දක්වයි.



"නිවස හා නිවැසියෝ, පෙරහැර හා ආගමික උත්සව, විහාර, කෝවිල්, මස්ජිත් පල්ලි, උප්පැන්න, මරණ, විවාහ, ග්‍රාමීය උත්සව, ගුවන්විදුලිය, රූපවාහිනිය, සිනමාව, පලාත් මට්ටමේ උත්සව, ජාතික මට්ටමේ විවිධ උත්සව, ජාතික දින සැමරුම් හා විවිධ උත්සව, ජාතික ප්‍රතිපත්ති, සැලසුම්, පර්යේෂණ, අධ්‍යක්ෂණය, අන්තර්ජාතික සම්බන්ධතා, සම්මුති, යුනෙස්කෝ, සාක් සංවිධාන, සිරිත් විරිත්, වත් පිළිවෙත්, කලා, ක්‍රීඩා, සෞන්දර්ය, නාට්‍ය."

**බහු සංස්කෘතික විෂයමාලාවක් සහිත අධ්‍යාපනයක් දීමේ අවශ්‍යතාව**

බහු සංස්කෘතික අධ්‍යාපනයක් දීමේ අවශ්‍යතා ප්‍රධාන ලෙස පහත සඳහන් ආකාරයට පෙළගැස්විය හැකිය.

- ➢ සෙසු සංස්කෘතීන් පිළිබඳ වැරදි සංජානනයන් වෙනස් කිරීම සඳහා
- ➢ එකම සංස්කෘතියකට විවිධ ජාතීන් සමාග්‍රහණය කිරීම සඳහා
- ➢ සාමය ඇතිකිරීම සඳහා
- ➢ ගැටුම් අවම කිරීම සඳහා
- ➢ ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇතිකිරීම සඳහා.
- ➢ විවිධ ජාතීන්ට ගරු කිරීම සඳහා
- ➢ සංවර්ධනය සඳහා විවිධ ජාතීන් සම්බන්ධ කරගැනීම සඳහා
- ➢ අධ්‍යාපනයේ සම අවස්ථා ඇතිකිරීම සඳහා
- ➢ සිසුන්ගේ දක්ෂතාව උපරිම ලෙස සංවර්ධනය කිරීම සඳහා
- ➢ ආර්ථික සම්පත් තුලනාත්මකව භුක්තිවිඳීම සඳහා
- ➢ මනා අන්තර් සම්බන්ධතා ඇතිකිරීමට

උක්ත කරුණුවලට අනුව බහු සංස්කෘතික අධ්‍යාපනයේ වැදගත්කම පැහැදිලි වේ. සමාජයක සංවර්ධනය උදෙසා බහු සංස්කෘතික අධ්‍යාපනය බෙහෙවින්ම වැදගත් වන බව එඩ්ගා ෆෝරේ පේන්වා දෙයි. සමාජයත් අධ්‍යාපනයත් අතර සමීප සම්බන්ධතාවක් පැවතීම යමෙකුගේ මනස දියුණු කිරීමටත් සංස්කෘතිය ලබා ගැනීමටත් ඉතා වැදගත් බව ඔහු තවදුරටත් පෙන්වා දෙයි. මිනිසුන් සමාජ ජීවිතය සඳහා සූදානම් කරවීමේදී විශාල කාර්යයක් ඉටු කරන්නේ අධ්‍යාපනයයි. සීඝ්‍ර ලෙස දියුණුවෙමින් පවතින ලෝකයේ මිනිසුන්ගේ

දැනුම ආකල්ප හා කුසලතා බෙදා ගැනීමට බහු සංස්කෘතික අධ්‍යාපනය යොදාගත යුතුය. විචාරක මතය අනුව අධ්‍යාපනයේ සම අවස්ථා බහුවිධ සමාජයක අවම මට්ටමක පවතී.

"බ්‍රැන්ක්ස්" පෙන්වා දෙන පරිදි සුළු ජන කොටස් සහිත සමාජයක අධ්‍යාපනයේ සම අවස්ථා නැතිවීම කැපී පෙනෙන ලක්ෂණයකි. ඇමරිකාවේ නිග්‍රෝවරුන්ගේ තත්ත්වය මීට උදාහරණය. වර්ණය පමණක් නොව වෙනත් බොහෝ අවස්ථාවලදී ද මෙම තත්ත්වය දැකිය හැකි බව ඔහු තවදුරටත් පෙන්වා දෙයි. බටහිර රටවල වර්ණය අතින් පමණක් නොව අධ්‍යාපනය ආදී වශයෙන් ද මෙම සම අවස්ථා අපේක්ෂා කරයි. ඇමරිකාවේ සම අවස්ථා ඇතිකිරීමට ගන්නා ප්‍රයත්නය ප්‍රශස්ථ මට්ටමක පවතින බව විචාරක මතයයි. එහෙත් එය සම්පූර්ණයෙන්ම සුළු ජාතිකයන් සඳහා ක්‍රියාත්මක නොවන බව දක්වයි. අධ්‍යාපනය, නිවස රැකීරක්ෂා වැනි විවිධ අවස්ථා සඳහා සම අවස්ථා නොලැබීම නිසා විවිධ ගැටුම් ඇතිකරගත් අවස්ථා ඇත. පර්යේෂකයන් පෙන්වා දෙන්නේ බොහෝ ගුරුවරු සුළු ජාතික සිසුන්ට පංතිකාමරයේදී සම අවස්ථා ලබා දීමට උත්සුක නොවන බවයි. උක්ත හේතුව මත ඔවුනගේ අධ්‍යාපන මට්ටම පහත් තත්ත්වයක පවතී.

සුළු ජාතිකයන් වෙන්කොට ඉගැන්වීම සමහර අවස්ථාවල දැකිය හැකිය. ඔවුන් කෙරෙහි වැරදි පූර්ව විනිශ්චයන් පැවතීම, පන්තිකාමර අන්තර්ක්‍රියාව අතහැර දැමීම, නායකත්වය නොදීම, අදහස් නොපිළිගැනීම, සුළු ජාතිකයන්ගේ අධ්‍යාපනය කෙරෙහි උසස් බලාපොරොත්තු ඇතිකර නොගැනීම දැකිය හැකිය.

"බැන්ක්ස්" තම පර්යේෂණයෙන් පෙන්වා දෙන්නේ භාෂා ප්‍රශ්නය, දරිද්‍රතාවය, හා ඔවුන්ගේ සංස්කෘතිය මෙයට බලපා ඇති බවයි. මොවුන්ට දක්වන සැළකිල්ල සමාජයෙන් සමාජයට වෙනස් වේ. ඉහත අරමුණු ඉටුකර ගැනීමට බහු සංස්කෘතික අධ්‍යාපනය වැදගත්වේ.

පාසැල් විෂයමාලාවේ පොළපොත් වෙනස් කිරීමේදී බහු සංස්කෘතික අධ්‍යාපනය ගැන සැළකිලිමත් විය යුතුය. එහි දී වෙනත් සංස්කෘතීන්ගේ වීරයන් වීර දින ආගමික ඇදහිලි විශ්වාස උත්සව ආදිය පිලිබඳ තොරතුරු ඇතුළත් කිරීම ඉතා වැදගත් වේ. පෙළ පොත් සකස් කිරීමේදී පහත කරුණු පිළිබඳව අවධානය යොමුකළ යුතුය.



1. වාර්ගික, ආගමික, හා සංස්කෘතික සමාජ සහජීවනයට ප්‍රතිෂේධාත්මක කරුණු
2. වාර්ගික, ආගමික, හා සංස්කෘතික සමාජ සහජීවනය සඳහා යොදාගත හැකි එහෙත් නොසළකා ඇති විෂය කරුණු හා ඒවා වැඩිදියුණු කරගත හැකි ආකාරය
3. වාර්ගික, ආගමික, හා සංස්කෘතික සමාජ සහජීවනය ඇතිකිරීම සඳහා යොදාගත හැකි නව විෂය කොටස් පිළිබද අවධාවනය

(බහුවිධ සමාජ සහජීවනය සඳහා පාසල් පෙළ පොතේ භූමිකාව -1998)

පෙළ පොතින් බහුවිධ සමාජයක අවශ්‍යතා සම්පූර්ණ වන ලෙස සියලු සංස්කෘතීන් පිළිබඳ කරුණු ඇතුළත් කළ යුතුය. බහු සංස්කෘතික අවශ්‍යතා ඉටුකිරීමට පෙළපොත හොද උපකරණයකි. එහිදී විවිධ ජාතීන්ට අයත් ජන කොටස් වෙන් වෙන් ලෙස අගය කරනවාට වඩා පොදුවේ අගය කළ යුතුය. උසස් විනයක් ඇතිකරන සියලු ආගම්වල හරයන් පෙළ පොත්වල ඇතුළත් කළ යුතුය. විවිධ ජන කොටස්වල පොදු වූ සංස්කෘතික සංකල්ප පෙළ පොත්වල වඩාත් හොඳින් විවරණය කළ යුතුය.

උදාහරණ ලෙස වැඩිහිටියන්ට සැළකීම, අසරණයන්ට පිහිට වීම දැක්විය හැකිය.

සුළු ජනකොටස්වල ඉගෙනුම් අවස්ථා වැඩිකිරීම සඳහා අවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය වැඩි වශයෙන් ලබාදිය යුතුය. සුළු ජනකොටස්වල තොරතුරු ප්‍රමාණවත් පරිදි ඇතුළත් කිරීම හා ඊට එරෙහිව ඇති පූර්ව විනිශ්චයන් ඉවත් කිරීම ඉතා යෝග්‍ය වේ.

**බහු සංස්කෘතික අධ්‍යාපන ගැටළු**

උක්ත ගැටළු ක්ෂේත්‍ර 3ක් ඔස්සේ දැක්විය හැකිය
1. වාර්ගික අනන්‍යතාව ආරක්ෂා කිරීම පිළිබඳ ගැටළු
2. ජාතික අනන්‍යතාව ආරක්ෂා කිරීම පිළිබඳ ගැටළු
3. ජාත්‍යන්තර අනන්‍යතාව පිළිබඳ ගැටළු

වාර්ගික අනන්‍යතාව නියෝජනය කරන භාෂාව, ආගම, කලාව, ජීවිත පිළිවෙත් ආරක්ෂා වන පරිදි අධ්‍යාපනය හැසිර විය

යුතුය. එහිදී මවු භාෂාවට මූලික තැනක් දිය යුතුය. ඒ අනුව විවිධ වාර්ගිකයන් විවිධ පාසල් වල ඉගෙන ගැනීමට යොමුකිරීමට වඩා සියලු වාර්ගිකයන් ඒකම පාසලක ඉගෙන ගන්නා පාසල් පද්ධතියක් සකස් කළ යුතුය. එහිදි අවශ්‍ය පරිදි භාෂා මාධ්‍ය කිහිපයකින් අධ්‍යාපනය ලැබීමේ අවස්ථා ඇතිකළ හැකිය. එහිදී භාෂා වශයෙන් බෙදීම නිසා වාර්ගික බව වැඩිවන බව දක්වා ඇත. සියලු දෙනාට පොදු ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලබා දී තමාගේ භාෂාව ඉගෙන ගැනීමටද අවස්ථාව ලබාදිය හැකිය. එහිදී පොදු භාෂාවෙන් අන්තර්ක්‍රියාව සිදුවන අතර එකට හැසිරීම නිසා සුහදශිලීභාවය ඇතිවේ. කලා අධාපනයේදී බටහිර කලාවන් උසස් බවත් පෙරදිග කලාවන් පහත් බවටත් සළකන මානසිකත්වයක් බ්‍රිතාන්‍යයේ පවතී.කලාව මාධ්‍ය කරගෙන විවිධ වාර්ගික ස්වභාවයන් පෙන්නුම් කරන්නට උත්සාහ ගෙන ඇත. ආගම ඉගැන්වීමේදී ද මෙම තත්ත්වය වෙනස් කළ යුතුය.

ජාතික භාෂාවක් ඉගෙන ගැනීමත් තම භාෂාව ඉගෙන ගැනීමත් ජාත්‍යන්තර වශයෙන් භාෂාවක් ඉගෙන ගැනීමට සිදුවීමත් ගැටළුවකි. උදාහරණ ලෙස ශ්‍රී ලාංකික දෙමළ ජනයාට ජාතික භාෂාව ලෙස සිංහල ද තම භාෂාව ලෙස දෙමළ භාෂාව ද ජාත්‍යන්තර භාෂාව ලෙස ඉංග්‍රීසි ද ඉගෙන ගැනීමට සිදුව ඇත. මේ නිසා ජාතික අනන්‍යතාව සඳහා එකම ආයතනයක් තුළ ඉගෙන ගැනීම ඉතා වැදගත් වේ. යුනෙස්කො වැනි සංවිධාන එක්ව ජාත්‍යන්තර ලෙස එකම මානව සංහතියක් ලෙස සළකා පොදු ප්‍රශ්න අධ්‍යාපනයට එක් කිරීම කාලෝචිතය. උදාහරණ ලෙස පරිසර දූෂණය, යුද්ධය වැනි ගැටළු ගත හැකිය. එහිදී සියලු දෙනා එක්ව සිට එම අභියෝග ජයගත යුතුය. එහිදී වාරිගික බව ජාතිකත්වය හා ජාත්‍යන්තර අනන්‍යතාව යන කරුණු තුන පිළිබඳව අවධානය යොමු කරමින් එහි තුලනයක් ඇතිකිරීම ඉතා කාලෝචිතය.

බහු සංස්කෘතික අධ්‍යාපනයක් ලබාදීම වර්තමානයට ඉතාමත් කාලෝචිතය. එහිදී අධ්‍යානයේ සම අවස්ථා ඇතිකරීම, ජාතික සමගිය, අන්තර්ජාතික අවබෝධය පාසල තුළින් ලබාදීම, සමස්ත ප්‍රජවටම එකසේ පිළිගත හැකි විනය පිළිවෙතක් සකස් කිරීම, වෙන්ත සංස්කෘතීන්ට ගරු කිරීම, තමාගේ ආරක්ෂාව තහවුරුකර ගැනීම, සියලු දෙනා කෙරෙහි වෙනස්කම්ක් නොමැතිව යහපත් ආකල්ප ඇතිකර



ගැනීම සඳහා උපකාර වන අධ්‍යාපනයක් ලබාදීම ප්‍රධාන ලක්ෂණ විය යුතුය.

උක්ත කරුණු ඉටුකර ගැනීම සඳහා ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් වැනි පොදු මාධ්‍ය සමස්ත ජනතාව ඉලක්ක කර මෙහෙයවිය යුතුය. පාසල් කටයුතුවලදී විෂය සමගාමි කටයුතු නායකත්ව පුහුණුවීම්, සාහිත්‍ය නිර්මාණ, පෞරුෂ වර්ධන වැඩසටහන්, සංස්කෘතික සහ ප්‍රජා සංවර්ධන කටයුතු, වාර්ෂික ක්‍රියාකාරකම්, සැඟවුණු විෂයමාලාව හා ගුරුවරුන්ට සංස්කෘතික අධ්‍යාපයනයක් ලබාදීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාවයක් ලබාදිය යුතුය.

ආශ්‍රිත ග්‍රන්ථ


01. **දිවි පැවැත්ම සඳහා ඉගෙනුම - එඩ්ගා ෆෝරේ ඇතුළු පිරිස.1972,**
02. අධ්‍යාපන සමාජ විද්‍යාව - ගලගමගේ එස්. කර්තෘ, 2005,පනිපිටිය
03. අධ්‍යාපන මූලධර්ම ලිපි,අතුකෝරාළ , දයා රෝහන සහා අතුකෝරාළ හේලි නිමලා, 1991, ශික්ෂා මන්දිර, අළුබෝමුල්ල.
04. බහුවිධ සමාජ සහජීවනය සඳහා පාසල් පෙළපොතේ භූමිකාව,ශාම ශක්ති ගුරු සංවාද සංසදය,1998. ආණමඩුව.
05. ගැටුම් නිරාකරණයට හැදින්වීමක්, කාරුණාදාස, ඩබ්ලිව්.එම්. - 2003, ඉමේජ් ලංකා, දෙහිවල
06. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව, 1992, රජයේ මුද්‍රණ දේපාර්තමේන්තුව.
07. තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව, 1990, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
08. තුලනාත්මක පර්යාවලොකයකින් අධ්‍යාපනය 11 ඒකකය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නුගේගොඩ
09. ජයසේන අශෝකා, අධ්‍යාපන සමාජ විද්‍යාව, ගොඩගේ, කොළඹ,


02 OCT 2015